# කවිය ගීතය හා නිසඳැස් කවිය

කාව්‍යමය සිතිවිලි ගද්‍යයෙනුත් පද්‍යයෙනුත් ප්‍රකාශ කල හැකි ය. ගද්‍ය පද්‍ය දෙකෙන්ම ලියන කාව්‍ය චම්පු නම් වේ. අපි අද පද්‍ය (සීපද) කවි 'කවි' නමින් හඳුන්වමු. සීපදයකට එලිවැටක් තිබිය යුතු යය් නියමයක් නැත . රංචාගොඩ ලමයාගේ සීපද වල එලිවැට නැත . එලිවැටක් යොදන්නේ තමන්ගේ හපන්කම් දැක්වීමටය. එලිවැට යමක ගබසක යවහන් ගැන සිත යොමු කල විට අදහස යටපත් වේ. සිලෝ ලියන්නේ අකුරු විරිතිනි. එයද ඉතා දුෂ්කර කාරියකි.

අපේ ගීයට එලිවැටක් නැත . එහි පද 4 සමාන විය යුතු නැත . මාත්‍රා 8 ත් 14ත් අතර පද 4ක් ඇති ගී ලිවීම ඉතා පහසුය. කිසිදු විරිතකට අයත් නැති ගී සිය (දහස්) ගණනක් සීගිරියේ දක්නට ඇත . අපේ බසේ හැම වැකියක් ම තාලයට ගැයිය හැකි යය් කියති. එසේ නම් එකක් යට එකක් සිටින සේ වැකකි 4 ක් ලියු විට එය ගීයකි. පද වැඩි ගනනකින් ලියන පැලලි (බට පැලලි වැනි) කවි යනු කිසිදු නීතියකට නැති ව වැකිය බෙදා පද හැටියට ලියන ඒවා ය.

කාව්‍යමය ආකෘතියකින් ඉදිරිපත් කරන නිසඳැස් කවි කියවන්නේ ලෝකෝපකාරය හෝ සුභාෂිතය කියවන විදියට ද? නැතහොත් බුත්සරන පූජාවලිය කියවන විදියට ද? එසේත් නැත්නම් පිරිත් මන්තර කියවන විදියට ද? යනු පැහැදිලි නැත .

ඉස්පිලි පාපිලි අඩු වචන ලියන්නේ ත් වියරනය මරමින් වැකකි ලියන්නේත් විරිතකට නැති කවි ලියන්නේත් ඇය් ද යනු කිවයුතු නොවේ. කෑලි හැලෙන ලොරි වල පටවාගෙන රන්කාසි මිනිමුතු ගෙන යෑම හොඳ නැත .

සිත දිරිමත් කරගෙන (10)
රසවත් මෙන්ම හරවත් (11)
අදහසක් පවසන්නට (11)
ඔබට නොහැකි ද හොඳ ගීයකින් (14)

(සම්මත විරිතක් නොවේ)

වි ක ධර්මබන්දු

## ඉතිරි පැතිරි

හැම තැනම හිම
නැති හැටි තැනක්
හිම බලන්නවත්
අඩිය ගහන්න

ඈනොන්

## ගංවතුර

මහ වැස්ස වැස්සාම
උතුරලා යන ගඟ
කාටවත් වැඩක් නැති
ලොකුම ලොකු
වතුර කඳ

රංග වීරක්කොඩි

පහන් වැට
සන්නස
22 Lorne Street
Lalor Vic 3075
Australia

## කවි නොවේ

වා සුළියක් සමග
අගනුවරින්
දුර-කථනයෙන් ආ
ඇමතුමකි දයාබර....

"-කවියාණනි සුහද
දෙවියන්ගෙ අඩවියේ
කඳු වළල්ල පැලී
වියරු වී කළු ගං කොමලිය
නාය ගොස් ජනපද දිවි පොඩි
ගැලූ දුක් කඳ ගැන
ඔබට කවි සිතුවිලි පුදුම
පහළ වනු ඇති නේද?

කියනු මැන
කවදාද ඒ කවි
අප ඇසට ලැබෙන්නේ...?"

- නැත එහෙම කවි සිතුවිලි
- නැත එහෙම කවි ලියන්නේ

("... නැහැ අද නොවේ
මතු කලෙක සෙමෙන්
ඒවා ලියැවේවි නොවෙද?")

- නැත කිසිකලෙක නැත
එවැනි කවි ලියන්නේ
එහා ගෙදරක
පිය පුතු දෙදෙනෙකු
ගෙට ගැලූ මඩ කඳ අදින විට
එතැනට යා යුතුය දැන්
මඩ අදින්නට

කුටියකට වී
උන් ගැන ලියන කවි
කවි නොවේ නයි මිසක!

පරාක්‍රම කොඩිතුවක්කු
උපුටනය- "ආලෝක මිනිසා" කාව්‍ය සංග්‍රහයෙන්

නර්තන සහස්‍රා ප්‍රසංගය සමගින් අප හමුවට එන නර්තන ශිල්පියා

# දිනේෂ් ඈපාසිංහ

නර්තන සහස්‍රා ප්‍රසංගය සමගින් අප හමුවට එන නර්තන ශිල්පියා දිනේෂ් ඈපාසිංහ පසුගියදා සන්නස සමග මෙසේ සාක්ච්ඡාවකට සම්බන්ධ විය.

සන්නස
දිනේෂ් මේ ප්‍රසංගය ගැන අපට විස්තරයක් කරන්න පුලුවන් ද?

දිනේෂ්
මෙම ප්‍රසංගයට සහභාගි වන්නේ මගේ ශිෂ්‍යයන්ද ඇතුලුව මගේ අභින නර්තන කණ්ඩායමයි. මෙම කණ්ඩායමට තිස් දෙනෙක් පමණ සහභාගි වෙනවා. විශේෂයෙන් කුඩා දරුවන්ගේ අංගයකුත් මෙයට ඇතුලත් වෙනවා.

සන්නස
මේ ප්‍රසංගයට ඇතුලත් වන නර්තන අංග ගැන යමක් කියන්න

දිනේෂ්
පූජා නැටුම නාග ගුරුළු තේ දළු නෙලීම ගිරි දේවී රංගනය
ගජගා වන්නම ගොයම් නැටුම් කුළු නැටුම් ආදියද ගීත කීපයකට කළ නිර්මාණ ද මෙයට ඇතුළත් වෙනවා. මෙම නැටුම් අංග සියල්ලම සෑම දෙනාටම රස විඳිය හැකි ආකාරයෙන් මම සකස් කොට තිබෙනවා.

සන්නස
ඔබේ නැටුම් පන්ති පැවැත්වීමේ අරමුණ කුමක් ද?

දිනේෂ්
මම දැනට ඩැන්ඩිනොන් සහ තෝමස්ටවුන් වල නර්තන පන්ති දෙකක් පවත්වනවා. මගේ අරමුණ තමයි ලංකාවේ අපට උරුම සංස්කෘතිකාංගයක් වන නැටුම් කලාව මෙහි වෙසෙන ශ්‍රී ලාංකික දරු දැරියන්ට කියා දීම.

සන්නස
සතියකට වරක් මෙහෙම පන්ති පැවැත්වීමෙන් ඔබේ අරමුණ සාක්සාත් කර ගත හැකි යයි ඔබ සිතනවාද?

දිනේෂ්
සිතුරාදා හැන්දෑවේ හෝ නිවාඩු දිනවල නයිට් ක්ලබ් හෝ ඩීජේ එකකට සහභාගි වී නටා එන අයට සාම්ප්‍රදායික තාල වලට අඩි තියන එක විහිලුවක් තමයි. නමුත් මම නර්තනය පටන් ගන්නෙ ගජගා වන්නමෙන් නෙවෙයි. මම උත්සාහ කරන්නෙ නර්තනයේ මූලික සරඹ කියා දෙන්නයි. එය රසවත් වුණොත් දරුවා රංගන විෂයයට උනන්දු වෙනවා. සතියකට පැය තුනක් කරලා වෘත්තියශිල්පියෙක් බිහි කරන්න අමාරුයි. නමුත් ඔවුන් හරි මගකට ගත හැකි බ වමට විශ්වාසයි. මා සමග දැනට නැටුම් පුහුනු වන දරුවන් සියලු දෙනා ම ඉතා උනන්දුවෙන් මෙය හදාරනවා. මගේ බලාපොරොත්තුවක් තමයි ඔස්ට්‍රේලියාවේ වෙසෙන දරුවන්ගෙන් උඩරට නැටුමේ මහෝත්සවය වන වෙස් බැඳීමේ උත්සවයක් කරන්නයි. මම වෙස් බැඳීම දක්වා උගන්වන්න කැප වෙනවා.

සන්නස
ඔබේ නැටුම් ගුරුවරු ගැන යමක් කියන්න
දිනේෂ්
මම මුලින්ම නැටුම් ඉගෙන ගත්තෙ එච් එම් රත්නායක විද්‍යාරත්න ප්‍රනාන්දු කුලසිරි බුදවත්ත තොම්සන් ප්‍රනාන්දු වැනි ප්‍රවීණයන්ගෙන්. ජාතික තරුණ සේවා සභාව හා බස්නාහිර පළාත් නාට්‍ය කණ්ඩාම් නියෝජනය කරමින් රටවල් 14ක පමණ පැවැත් වූ නැටුම් ප්‍රසංග වලට මම සහභාගි වී තිබෙනවා. ඒ අතරම මම ඉසිපතන විද්‍යාලයේ නැටුම් ආචාර්යවරයකු ලෙස සේවය කළා. දැනට මම මොනෑෂ් විශ්ව විද්‍යාලයේ නර්තනය පිලිබඳව උපාධි පාඨමාලාවක්හදාරනවා.

සන්නස
ඔබ ඉදිරිපත් කරන නර්තන සහස්‍රා ප්‍රසංගයේ විශේෂත්වය කුමක් ද?

දිනේෂ්
මෙහි විශේෂත්වය තමයි සියලුම අංග සඳහා බෙර වාදනය කෙරෙන්නේ සජීව්ව වීම. අප සියලු දෙනා නැටුම් ඉදිරිපත් කරන්නේ හඬ පට වලට නෙවෙයි. එහි විශාල වෙනසක් තියෙනවා. නර්තන ශිල්පියා හා වාද්‍ය ශිල්පියා අතර ගොඩ නැගෙන නිර්මාණාත්මක සම්බන්ධතාව තමයි ප්‍රේක්ෂකයාගේ හදවතට දැනෙන්නේ. එය අලුත් අත්දැකීමක් වේවි.

ජීලි 14 වන දා සවස 6 ට බර්වුඩ් බීසන් සෙන්ටර් හිදී පැවැත්වෙන නර්තන සහස්‍රා ප්‍රසංගය බෙරික් ශාඛ්‍යමුණි සම්බුද්ධ විහාරයේ ඉදිකිරීම් වලට ආධාර පිනිස පැවැත්වෙන අතර ඔබ සැමගේ සහය එයට නොඅඩුව ලැබෙතැයි සන්නස බලා පොරොත්තු වෙයි.

ශ්‍රීනාත් මද්දුමගේ







## තේරවිල්ල

අතිංගා ඇල්ලේ මුව දෙන් සිටින්නේ
බෙල්ල දිගට අං ඇවිදින් වදන්නේ
මෙතෙක් පෙරවූ සළු පිළි ඇද ඉරන්නේ
මෙතුන් පදේ තෝරාලා කියන්නේ

ලබ් බූසංගෙ